ඒකාබද්ධ සේවා චක්‍රලේඛ අංක: 05/2017

මගේ අංකය: PA/CS/POLICY/කා.ක.ඉම් විභාග IV
ඒකාබද්ධ සේවා අංශය
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ
අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2017.11.16 දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපතිවරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සිට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II පන්තියට/ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන්ට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වීම සඳහා සහන කාලයක් ලබාදීම</u>**

නියමිත පරිදි විභාග නොපැවැත්වීම හේතුවෙන් නියමිත දිනයන්ට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වීමට නොහැකි වූ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන්ට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වීම සඳහා සහන සලසන ලද 2017.02.16 දිනැති ඒකාබද්ධ සේවා චක්‍රලේඛ අංක 01/2017 කෙරෙහි අවධානය යොමු කරවමි. එය පූර්වාදර්ශ කරගනිමින් සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සිට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන පන්තියට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන්ට පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා සහන සලසාදීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව නියෝග කර ඇත.

i. පූර්ව සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන පන්තියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂයයක් වූ සෞඛ්‍ය ආයතන හා රෝහල් පරිපාලනය යන විෂයය සම්පූර්ණ කිරීම සඳහා 2006.09.11 දින සිට 2009.10.14 දින දක්වා සහන කාලයක් ලබා දීම

ii. පූර්ව සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාව අනුව සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන පන්තියට අදාළ සහ පසුව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන පන්තියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කිරීම සඳහා සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවය 2003.05.01 දින පිහිටුවීමෙන් පසුව එම සේවයේ II වන පන්තියට උසස් කිරීමේ ලිපිය නිකුත් කළ දින සිට පැවැත්වූ අනුයාත විභාග වාර 06ක (හයක) සහන කාලයක් ලබා දීම.

02. ඒ අනුව II වන පන්තියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම / සම්පූර්ණ කිරීම ප්‍රමාදවීම හේතුවෙන්;

i. II වන ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වීමට නොහැකි වීම මත වැටුප් වර්ධක විලම්භනය වූ නිලධාරීන් ද
ii. ඒ හේතුවෙන් සාමාන්‍ය කාර්ය සාධනය මත I වන ශ්‍රේණියේ උසස්වීම නියමිත කාලයට වඩා ප්‍රමාද වී ලැබී ඇති නිලධාරීන් ද

මේ යටතේ සිය විලම්භනය වූ වැටුප් වර්ධක සහ ඒ හේතුවෙන් ප්‍රමාද වූ සාමාන්‍ය කාර්ය සාධනය මත I වන ශ්‍රේණියේ උසස්වීම් (අංක 1372/23 හා 2004.12.24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ 12.3 සහ 2013.04.02 දිනැති එම සේවා ව්‍යවස්ථාවේ 10.2 වගන්තිවල සඳහන්) <u>**පමණක්**</u> යථාවත් කරගැනීම සඳහා දැනටමත් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ හෝ උසස්වීම් සඳහා හෝ සහන ඉල්ලා අභියාචනා ඉදිරිපත් කර නොමැති

නිලධාරින් ද සිය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය ද සහිත ඉල්ලීමක් මා වෙත ඉදිරිපත් කළ යුතුය.

03. මෙය අතීතයට ද බලපාන පරිදි සිදුකරනු ලබන සහන සැලසීමක් වන හෙයින් ද අතීතයේදී අහිමි වූ අවස්ථා පිළිබඳව කිසියම් පිළියමක් වර්තමානයේ දී යෙදිය නොහැකි හෙයින් ද එවැනි කරුණුවලදී ගත් අතීත ක්‍රියාමාර්ගයන්ට අගතියක් නොවන පරිදි කටයුතු කළ යුතු හෙයින් ද පහත දක්වා ඇති අහිමි වූ අවස්ථා පිළිබඳව ඉදිරිපත් කරනු ලබන අභියාචනා සලකා බැලීමට අවකාශ නොමැති බව අවධාරණය කරමි.

i. මෙම සහනය හිමිවීමට පෙර සිදුවූ වැටුප් වර්ධක විලම්භන හේතුවෙන් අහිමි වූ, වෙනත් සේවාවන්ට පිවිසීමට හෝ උසස්වීම් (අංක 1372/23 හා 2004.12.24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ 2004.12.24 දිනැති සේවා ව්‍යවස්ථාවේ 12.2 වගන්තිය යටතේ සඳහන්) සඳහා වූ හෝ තරඟ විභාගයන්ට/සම්මුඛ පරීක්ෂණයන්ට හෝ එවැනි කිසියම් තෝරාගැනීමක් වෙනුවෙන් වූ අවස්ථාවක් සඳහා පෙනී සිටීමේ අවස්ථාවක් අහිමිවීම පිළිබඳව සහන ඉල්ලා ඉදිරිපත් කරන අභියාචනා.
ii. මෙම සහනය හිමිවීමට පෙර සිදුවූ වැටුප් වර්ධක විලම්භනය හේතුවෙන් අහිමි වූ තනතුරු ලැබීමේ අවස්ථාවන් පිළිබඳ සහන ඉල්ලා ඉදිරිපත් කරන අභියාචනා.
iii. මෙම සහනය හිමිවීමට පෙර සිදුවූ වැටුප් වර්ධක විලම්භනයවීම් හඳුනා නොගෙන/නොසලකමින් සාවද්‍ය ලෙසින් උසස්වීම් හෝ වෙනයම් තරඟ විභාගයන්ට අයදුම්කර ඉන් සමත්ව සම්මුඛ පරීක්ෂණයේ දී හෝ වෙනයම් පසු අවස්ථාවක දී වැටුප් වර්ධක විලම්භනය හඳුනා ගැනීම හෝ සැලකීම හේතුවෙන් අදාළ උසස්වීම හෝ විභාගයේ ප්‍රතිඵල මත කෙරෙන පත්වීම හෝ වරප්‍රසාදය ලැබීම අත්හිටුවා ඇති නිලධාරීන් විසින් එම අත්හිටවූ පත්වීම්/වරප්‍රසාදය ලබාගැනීමට ඉදිරිපත් කරන අභියාචනා.

04. 2003.05.01 දිනට පෙර සෞඛ්‍ය ලිපිකාර සේවයට පත්ව එම සේවයේ II'අ' ඛණ්ඩයට උසස්ව II'අ' ඛණ්ඩයට අදාළ කාර්යක්ෂමතා කඩඉම 2003.05.01 දින දක්වා සමත්ව නොමැති නිලධාරීන්ට ද 2003.05.01 පසුව මෙම චක්‍රලේඛය යටතේ අදාළ කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරීමට මෙමගින් අනුයාත විභාග අවස්ථා 06ක් හිමිවන නමුත් එදිනට එනම් 2003.05.01 දිනට පෙර එය සම්පූර්ණ නොකිරීම නිසා සිදුවී ඇති වැටුප් විලම්භනයක් වේ නම් එය එසේම පවතිනු ඇති අතර මෙමගින් ඊට සහනයක් හිමි නොවනු ඇත.

05. තව ද ඉහත 01 ii. වගන්තියේ දක්වන ලද අනුයාත විභාග අවස්ථා 06 ගණනය කිරීමේ දී II වන පන්තියට උසස් කිරීමේ ලිපිය නිකුත් කළ දින සිට පැවැත්වූ පූර්ව සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ විභාග අවස්ථා ද ඇතුළුව 2006.09.10 දිනෙන් පසුව පැවති රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන පන්තියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ ද ඇතුළුව සේවාවන් දෙකෙහිදීම ලද අනුයාත විභාග අවස්ථා ගණනය කළ යුතු අතර සේවාවන් දෙකෙහිදීම ලද අනුයාත විභාග අවස්ථා ගණන 06ක් විය යුතු අතර එය ඉක්මවා යාමට මෙමගින් අවස්ථාවක් හිමි නොවනු ඇත.



**කේ.වී.පී.එම්.ජේ. ගමගේ**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

පිටපත:
සියළුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් වෙත - දැ.ගැ.ස. සහ අ.ක.ස.